# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1907/26 - 2015 මාර්තු මස 25 වැනි බදාදා - 2015.03.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 213 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් කල්‍යානි දහනායක වන මම, එම පනතේ පිළිවෙලින් 107(2)(අ) සහ 107(2)(ආ) වගන්තීන්ගේ කාර්යය සඳහා, 2007 ජනවාරි මස 09 වැනි දින අංක 1479/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද දැන්වීම, එහි උපලේඛනයේ දැක්වෙන "I කොටස" ට ඉක්බිතිවම මෙම දැන්වීමේ උපලේඛනයේ දැක්වෙන " I අ කොටස " එකතු කිරීමෙන් සංශෝධනය කරමි.

කේ. දහනායක,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2015 මාර්තු 25 වැනි දින,
කොළඹ 02,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

"1අ කොටස

2015 අප්‍රේල් 1 දින හෝ ඉන් ඉක්බිතිව එළඹෙන යම් තක්සේරු වර්ෂයක් සඳහා, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 104 හා 104(අ) වගන්තීන්ගේ කාර්යය සඳහා, ආශ්‍රිත ව්‍යවසායයන් සමග සිදුකරනු ලබන ගනුදෙනු සම්බන්ධයෙන්, එම පනතේ 107(2)(අ) වගන්තිය යටතේ අනුමත ගණකාධිකාරීවරයාගේ සහතිකය.

1. බදු ගෙවන්නාගේ නම :
2. ලිපිනය :
3. බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN) :
4. තක්සේරු වර්ෂය :
5. පහත සඳහන් විස්තර සමග බදු ගෙවන්නා ගනුදෙනුවලට එළඹ ඇති ආශ්‍රිත ව්‍යවසායයන්ගේ ලැයිස්තුව ;

   (අ) ආශ්‍රිත ව්‍යවසායේ නම :

   (ආ) අංක 1823/5 හා 2013.08.12 දින දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* නියෝග 7 හි දක්වා ඇති පරිදි ආශ්‍රිත ව්‍යවසාය සමග පවත්නා වූ සම්බන්ධතාවයේ ස්වභාවය :

   (ඇ) ආශ්‍රිත ව්‍යවසාය විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයේ ලුහුඬු විස්තරය :

1A - PG 2415 — 13 (2015/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

6. භාණ්ඩ/ද්‍රව්‍ය එකලස් කිරීම/පිරිසැකසුම/නිෂ්පාදනය කිරීම සඳහා ආශ්‍රිත ව්‍යවසායයන්ගෙන්, අමුද්‍රව්‍ය හෝ වෙනත් යම් සැපයුම් මිලදී ගැනීම හෝ විකිණීම සම්බන්ධයෙන් බදු ගෙවන්නා ආශ්‍රිත ව්‍යවසායයක් සමග ගනුදෙනුවකට/ගනුදෙනු වලට එළඹ තිබේද ? ඔව්/නැත

'ඔව්' නම්, එක් එක් ආශ්‍රිත ව්‍යවසාය සහ එක් එක් ගනුදෙනුව හෝ ගනුදෙනු පංතියට අදාළව පහත සඳහන් විස්තර සපයන්න ;

(අ) ගනුදෙනු සඳහා එළඹී ආශ්‍රිත ව්‍යවසායයේ නම සහ ලිපිනය :

(ආ) මිලදී ගැනීම /විකිණීම සම්බන්ධ ගනුදෙනුවේ ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳ විස්තර :

(ඇ) ගනුදෙනුවේදී ගෙවන ලද / ලැබූ හෝ ගෙවිය යුතු / ලැබිය යුතු මුළු වටිනාකම ;

(i) මුල්‍ය ප්‍රකාශන අනුව :

(ii) අසම්බන්ධිත මිල සැලකිල්ලට ගෙන බදු ගෙවන්නා විසින් ආගණනය කරන ලද පරිදි :

(ඈ) අසම්බන්ධිත මිල නිශ්චය කිරීම සඳහා භාවිත කරන ලද ක්‍රමය / ක්‍රමයන් :
[අංක 1823/5 හා 2013.08.12 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* නියෝග I හි දක්වා ඇති පරිදි.]

7. වෙළඳ නිමි භාණ්ඩ මිලදී ගැනීම / විකිණීම සම්බන්ධයෙන් බදු ගෙවන්නා ආශ්‍රිත ව්‍යවසායයන් සමග ගනුදෙනුවකට / ගනුදෙනුවලට එළඹ තිබේද ? ඔව්/නැත

'ඔව්' නම් එක් එක් ආශ්‍රිත ව්‍යවසාය සහ එක් එක් ගනුදෙනුව හෝ ගනුදෙනු පන්තියට අදාලව පහත සඳහන් විසතර සපයන්න ;

(අ) ගනුදෙනු සඳහා එළඹී ආශ්‍රිත ව්‍යවසායේ නම සහ ලිපිනය :

(ආ) මිලදී ගැනීම / විකිණීම සම්බන්ධ ගනුදෙනුවේ ස්වභාවය හ ප්‍රමාණය පිළිබඳ විස්තර :

(ඇ) ගනුදෙනුවේදී ගෙවන ලද / ලැබූ හෝ ගෙවිය යුතු / ලැබිය යුතු මුළු වටිනාකම ;

(i) මුල්‍ය ප්‍රකාශන අනුව :

(ii) අසම්බන්ධිත මිල සැලකිල්ලට ගන්නා ලදුව, බදු ගෙවන්නා විසින් ආගණනය කරන ලද පරිදි :

(ඈ) අසම්බන්ධිත මිල නිශ්චය කිරීම සඳහා භාවිත කරන ලද ක්‍රමය/ක්‍රමයන් :
[අංක 1823/5 හා 2013.08.12 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ නියෝග 1 දක්වා ඇති පරිදි.]

8. වෙනත් යම් චංචල /නිශ්චල දේපළ මිල දී ගැනීම / විකිණීම හෝ එම දේපළ බදු දීම සම්බන්ධයෙන් බදු ගෙවන්නා ආශ්‍රිත ව්‍යවසායයන් සමග ගණුදෙනුවකට / ගණුදෙනුවලට එළඹ තිබේ ද ? ඔව්/නැත

'ඔව්' නම්, එක් එක් ආශ්‍රිත ව්‍යවසාය සහ එක් එක් ගනුදෙනුව හෝ ගනුදෙනු පන්තියට අදාලව පහත සඳහන් විස්තර සපයන්න ;

(අ) ගනුදෙනු සඳහා එළඹී ආශ්‍රිත ව්‍යවසායේ නම සහ ලිපිනය :

(ආ) දේපළෙහි සහ ගනුදෙනුවේ ස්වභාවය පිළිබඳ විස්තරය :

(ඇ) ගනුදෙනුව හා සම්බන්ධ නිශ්චල / චංචල දේපළෙහි එක් එක් වර්ගයේ ඒකක ගණන :

(ඈ) එක් එක් මිලදී ගැනීමේ/විකිණීමේ ගනුදෙනුවකදී ගෙවන ලද/ලැබූ හෝ ගෙවිය යුතු/ලැබිය යුතු වටිනාකම හෝ ලබා දෙන ලද/එළඹෙන ලද එක් එක් බදුදීම සම්බන්ධයෙන් ගෙවන ලද/ ලැබූ හෝ ගෙවිය යුතු/ ලැබිය යුතු බදු කුලිය ;

(i) මූල්‍ය ප්‍රකාශන අනුව :

(ii) අසම්බන්ධිත මිල සැලකිල්ලට ගන්නා ලදුව බදු ගෙවන්නා විසින් ආගණනය කරන ලද පරිදි :

(ඉ) අසම්බන්ධිත මිල නිශ්චය කිරීම සඳහා භාවිතා කරන ලද ක්‍රමය / ක්‍රමයන් :
[අංක 1823/5 හා 2013.08.12 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* නියෝග 1 දක්වා ඇති පරිදි ]

9. රාජ්‍යභාග, තාක්ෂණ දැනුම, පේටන්ට් බලපත්‍ර, කර්තෘ හිමිකම්, බලපත්‍ර වැනි අස්පෘශ්‍ය දේපළ මිලදී ගැනීම / විකිණීම /භාවිතය සම්බන්ධයෙන් බදු ගෙවන්නා, ආශ්‍රිත ව්‍යවසායයන් සමග යම් ගණුදෙනුවකට /ගනුදෙනුවලට එළඹ තිබේද ? ඔව්/නැත

'ඔව්' නම්, එක් එක් ආශ්‍රිත ව්‍යවසාය හා එක් එක් අස්පෘශ්‍ය දේපළ වර්ගය පිළිබඳව පහත සඳහන් විස්තර සපයන්න :

(අ) ගනුදෙනු සඳහා එළඹි ආශ්‍රිත ව්‍යවසායේ නම සහ ලිපිනය :

(ආ) අස්පෘශ්‍ය දේපළ හා ගනුදෙනුවේ ස්වභාවය පිළිබඳ විස්තරය :

(ඇ) එක් එක් අස්පෘශ්‍ය දේපළ වර්ගය මිලදී ගැනීම / විකිණීම / භාවිතය සඳහා ගෙවන ලද /ලැබූ හෝ ගෙවිය යුතු / ලැබිය යුතු වටිනාකම ;

(i) මූල්‍ය ප්‍රකාශන අනුව :

(ii) අසම්බන්ධිත මිල සැලකිල්ලට ගන්නා ලදුව, බදු ගෙවන්නා විසින් ආගණනය කරන ලද පරිදි :

(ඈ) අසම්බන්ධිත මිල නිශ්චය කිරීම සඳහා භාවිත කරන ලද ක්‍රමය / ක්‍රමයන් :
[අංක 1823/5 හා 2013.08.12 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* නියෝග 1 දක්වා ඇති පරිදි.]

10. මූල්‍ය කටයුතු, පරිපාලනය, තාක්ෂණික සේවා, වානිජ සේවා වැනි සේවා සම්බන්ධයෙන්, බදු ගෙවන්නා ආශ්‍රිත ව්‍යවසායයන් සමග යම් ගනුදෙනු වලට එළඹ තිබේද ? ඔව්/නැත

'ඔව්' නම්, එක් එක් ආශ්‍රිත ව්‍යවසාය හා එක් එක් සේවා වර්ගය සම්බන්ධයෙන් පහත සඳහන් විස්තර සපයන්න ;

(අ) ගනුදෙනු සඳහා එළඹි ආශ්‍රිත ව්‍යවසාය හෝ ආශ්‍රිත ව්‍යවසායයේ නම සහ ලිපිනය :

(ආ) ආශ්‍රිත ව්‍යවසායයන්ට සපයනලද හෝ ආශ්‍රිත ව්‍යවසායන්ගෙන් ලබා ගන්නා ලද සේවා පිළිබඳ විස්තරය :

(ඇ) සලසන ලද/ලබා ගන්නා ලද සේවාවන් වෙනුවෙන් ගෙවන ලද/ලැබූ හෝ ගෙවිය යුතු/ලැබිය යුතු වටිනාකම ;

(i) මූල්‍ය ප්‍රකාශන අනුව :

(ii) අසම්බන්ධිත මිල සැලකිල්ලට ගන්නා ලදුව, බදු ගෙවන්නා විසින් ආගණනය කරන ලද පරිදි :

(ඈ) අසම්බන්ධිත මිල නිශ්චය කිරීම සඳහා භාවිතා කරන ලද ක්‍රමය/ක්‍රමයන් :

[අංක 1823/5 හා 2013.08.12 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ නියෝග 1 දක්වා ඇති පරිදි.]

11. ආශ්‍රිත ව්‍යවසායයකට හෝ ව්‍යවසායයකින් ණය හෝ අත්තිකාරම් ලබාදීම/ ලබා ගැනීම සම්බන්ධයෙන් බදු ගෙවන්නා ආශ්‍රිත ව්‍යවසායයන් සමග ගනුදෙනුවකට / ගනුදෙනුවලට එළඹ තිබේද ? ඔව්/නැත

'ඔව්' නම්, එක් එක් ආශ්‍රිත ව්‍යවාසය සහ එක් එක් ණය / අත්තිකාරම් සම්බන්ධයෙන් පහත සඳහන් විස්තර සපයන්න ;

(අ) ගනුදෙනු සඳහා එළඹී ආශ්‍රිත ව්‍යවසායයේ නම සහ ලිපිනය :

(ආ) මූල්‍යකරණ ගිවිසුමේ ස්වභාවය :

(ඇ) ලබා දෙන ලද / ලබා ගන්නා ලද ණය /අත්තිකාරම් වලට අදාළ වටිනාකම සහ ව්‍යවහාර මුදල :

(ඈ) එක් එක් ණය / අත්තිකාරම් සම්බන්ධයෙන් අයකරන ලද / ගෙවන ලද පොලී අනුපාතිකය

(ඉ) ගනුදෙනුවෙහිදී ගෙවන ලද / ලබා ගන්නා ලද හෝ ගෙවිය යුතු /ලැබිය යුතු වටිනාකම ;

(i) මූල්‍ය ප්‍රකාශන අනුව :

(ii) අසම්බන්ධිත මිල සැලකිල්ලට ගෙන තක්සේරු කරනු ලබන්නා විසින් ආගණනය කරන ලද පරිදි :

(ඊ) අසම්බන්ධිත මිල නිශ්චය කිරීම සඳහා භාවිතා කරන ලද ක්‍රමය / ක්‍රමයන් :
[අංක 1823/5 හා 2013.08.12 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ නියෝග* 1 දක්වා ඇති පරිදි. ]

12. යම් ව්‍යවසායයන් එකකට හෝ වැඩි සංඛ්‍යාවකට සලසනු ලබන හෝ සලසනු ලැබිය හැකි ප්‍රතිලාභ, සේවා හෝ පහසුකම් සම්බන්ධයෙන් දරනු ලබන හෝ දරනු ලැබිය හැකි, යම් පිරිවැයක් හෝ වියදමක්, බෙදාදීම හෝ සමානුපාතිකව බෙදාදීම, හෝ යම් දායකත්වයක් සලසාදීම සඳහා, බදු ගෙවන්නා ආශ්‍රිත ව්‍යවසාය හෝ ව්‍යවසායයන් සමග අන්‍යොන්‍ය ගිවිසුමක් හෝ වැඩ පිළිවෙලකට එළඹ තිබේ ද ? ඔව්/නැත

'ඔව්' නම් එක් එක් ගිවිසුම හෝ වැඩ පිළිවෙල සම්බන්ධයෙන් පහත සඳහන් විස්තර සපයන්න.

(අ) අන්‍යොන්‍ය ගිවිසුමකට හෝ වැඩ පිළිවෙලට එළඹී ආශ්‍රිත ව්‍යවසායයේ නම සහ ලිපිනය :

(ආ) එම අන්‍යොන්‍ය ගිවිසුම හෝ වැඩ පිළිවෙල පිළිබඳ විස්තරය :

(ඇ) එකී එක් එක් ගනුදෙනුවේදී ගෙවන ලද / ලබා ගන්නා ලද හෝ ගෙවිය යුතු /ලැබිය යුතු වටිනාකම :

(i) මූල්‍ය ප්‍රකාශන අනුව :

(ii) අසම්බන්ධිත මිල සැලකිල්ලට ගන්නා ලදුව, තක්සේරු කරනු ලබන්නා විසින් ආගණනය කරන ලද පරිදි :

(ඈ) අසම්බන්ධිත මිල නිශ්චය කිරීම සඳහා භාවිතා කරන ලද ක්‍රමය / ක්‍රමයන් :
[අංක 1823/5 හා 2013.08.12 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ නියෝග* 1 දක්වා ඇති පරිදි.]

13. ආශ්‍රිත ව්‍යවසායයක් සමග, විශේෂයෙන් ඉහත 6, 7, 8, 9, 10, 11 හෝ 12 ඡේදයන් හි සඳහන් කර නොමැති වෙනත් යම් ගනුදෙනුවකට / ගනුදෙනුවලට බදු ගෙවන්නා එළඹ තිබේ ද ? ඔව්/නැත
'ඔව්' නම් එක් එක් ආශ්‍රිත ව්‍යවසාය සහ එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන් පහත සඳහන් විස්තර සපයන්න ;

(අ) ගනුදෙනුව සඳහා එළඹී ආශ්‍රිත ව්‍යවසායයේ නම සහ ලිපිනය :

(ආ) ගනුදෙනුවේ විස්තරය :

(ඇ) ගනුදෙනුවේදී ගෙවන ලද / ලබා ගන්නා ලද හෝ ගෙවිය යුතු /ලැබිය යුතු වටිනාකම ;

(i) මූල්‍ය ප්‍රකාශන අනුව :

(ii) අසම්බන්ධිත මිල සැලකිල්ලට ගන්නා ලදුව, බදු ගෙවන්නා විසින් ආගණනය කරන ලද පරිදි :

(ඈ) අසම්බන්ධිත මිල නිශ්චය කිරීම සඳහා භාවිතා කරන ලද ක්‍රමය / ක්‍රමයන් :
[අංක 1823/5 හා 2013.08.12 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ නියෝග 1 දක්වා ඇති පරිදි.]

14. .......................... මාර්තු මස 31 දිනෙන් අවසන් වන තක්සේරු වර්ෂය තුල බදුගෙවන්නා විසින් ආශ්‍රිත ව්‍යවසායයන් සමග එළැඹි ගනුදෙනුවලට අදාළව ...................... (TIN අංකය සමග බදුගෙවන්නාගේ නම) ගේ ගිණුම් සහ වාර්තා මම /අපි පරීක්ෂා කළෙමි/කළෙමු.

15. මගේ /අපගේ පරීක්ෂණයෙන් පෙනී යන පරිදි බදු ගෙවන්නා විසින් ආශ්‍රිත ව්‍යවසායයන් සමග එළඹ ඇති ගනුදෙනුවක් /ගනුදෙනු සම්බන්ධයෙන් නියම කර ඇති තොරතුරු සහ වාර්තා නිසි අයුරින් තබා ඇති / තබා නොමැති බව මගේ /අපගේ මතය වේ.

16. අංක 1823/5 හා 2013.08.12 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* නියෝග 9 යටතේ ඉදිරිපත් කළ යුතු බවට නියම කෙරෙන විස්තර සහතිකය ලබා දී ඇත. මාගේ/අපගේ මතය අනුව, සහ මාගේ/ අපගේ දැනගැනීමේ හැටියට සහ මා/අප වෙත ලබා දෙන ලද පැහැදිලි කිරීම් අනුව, සියළු ප්‍රමාණාත්මක තොරතුරු සහ විස්තර ලබාදී ඇති බවට මම/අපි සහතික කරමි/කරමු.

.............................................
අනුමත ගණකාධිකාරිවරයාගේ අත්සන.

නම :
ලිපිනය :

දිනය : ”

04-338

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.